# වෘත්තීය උපදේශක නිලධාරීන්ගේ

## ස්ථාන මාරු පටිපාටිය

01. හැඳින්වීම

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2009/02/20 දිනැති අංක 1589/30 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පටිපාටික රීති I වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 202 රීතියේ විධිවිධාන අනුව සමාජ සේවා දෙපාර්තමේන්තුවේ වෘත්තීය උපදේශක නිලධාරීන්ගේ ස්ථාන මාරු පටිපාටිය.

02. වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් වන නිලධාරීන් පිළිබඳ විස්තර

I. සේවාවේ වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කරනු ලැබූ හා කිසියම් සේවා ස්ථානයක අවු: 02 සම්පූර්ණ කළ නිලධාරීන්ට ස්ථාන මාරු අයදුම් කළ හැක.
II. එකම ස්ථානයක වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරීන් ස්ථාන මාරු වලට යටත් වේ.

03. වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ සංයුතිය පිළිබඳ විස්තර

I. නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) - සභාපති
II. පරිපාලන නිලධාරී
III. එක් එක් තනතුරට අදාළ තනතුරෙහි නිලධරයන්ගෙන් අවම වශයෙන් 15% ක නියෝජනයක් සහිත වෘත්තීය සමිති විසින් නම් කළ නියෝජිතයෙක්.

04. වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු සංයුතිය පිළිබඳ විස්තර

I. අධ්‍යක්ෂ - සභාපති
II. නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන)
III. පරිපාලන නිලධාරී

05. පොදු කරුණු

1. ස්ථානමාරු පටිපාටිය ක්‍රියාත්මක කිරීමේ දී ඒ ඒ තන්තුරු සහ සේවා ගණ වෙන වෙනම සළකා බැලිය යුතුය. එමෙන්ම එක් එක් තනතුර සඳහා වෙන වෙනම ස්ථාන මාරු ලේඛන සකස් කළ යුතුය.
2. භාර්යාව හා ස්වාමි පුරුෂයා යන දෙදෙනාම රාජ්‍ය සේවයේ නියුතු නම් ස්ථාන මාරු ඉල්ලීම් අනුව ස්ථාන මාරු කිරීමේදී දෙදෙනාටම එකම ප්‍රදේශයක සේවය කරන්නට ඉඩ ලබාදීමට ස්ථාන මාරු කමිටුව හැකිතාක් උත්සහ කළ යුතුය.
3. ආබාධිත දරුවන්, දීර්ඝ කාලීන අසනීප මත එක්තැන්ව සිටින කලත්‍රයන් වැනි පාලනයෙන් බැහැර මානුෂික හේතු සැලකිල්ලට ගත යුතුය.
4. ප්‍රියමනාප නොවන කාර්ය ස්ථානයන්ට ස්ථාන මාරු කිරීමේදී පාසල් යන දරුවන් සිටින නිලධාරීන් තෝරා ගැනීමට සැළකිලිමත් විය යුතුය.
5. ප්‍රියමනාප / ප්‍රියමනාප නොවන සේවා ස්ථාන තීරණය කිරීම හා සේවය කළ යුතු උපරිම /අවම සේවා කාලය තීරණය කිරීම සඳහා
   I. සේවයේ අවශ්‍යතාවය
   II. නිළධාරීන්ගේ ඉල්ලීම
   III. දුෂ්කර සේවයේ (ප්‍රියමනාප නොවන) යෙදී සිටි කාලය (සේවය කල කාලය අනුව ප්‍රමුඛතාවය දෙනු ලැබේ.)

Scanned with CamScanner

(එක් එක් තනතුර සඳහා ප්‍රියමනාප හා ප්‍රියමනාප නොවන ස්ථාන හා නිවාස පාලක තනතුර සඳහා වන විශේෂ කොන්දේසි ඇමුණුම 01 මගින් දක්වා ඇත.)

6. **යම් සේවා ස්ථානයක නිලධාරියෙකුට සේවය කළ යුතු උපරිම සේවා කාලයක් නියම කර ඇත්නම් එම සේවා කාලයෙන් අනතුරුව ස්ථාන මාරු ඉල්ලීම සැලකිල්ලට ගනු ලැබේ.**

## 06. වාර්ෂික ස්ථාන මාරු කාල සටහන

| | | |
|---|---|---|
| I. | ජුනි මස 30 දිනට පෙර | - වාර්ෂික ස්ථාන මාරු අයදුම් පත්‍ර කැඳවීම පිළිබඳව දැන්වීම නිකුත් කිරීම. |
| II. | ජූලි මස 31 දිනට පෙර | - සමාජ සේවා අධ්‍යක්ෂ වෙත වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම් පත්‍ර භාරදීම. |
| III. | අගෝස්තු මස 10 දිනට පෙර | - සමාජ සේවා අධ්‍යක්ෂ වෙත ලැබෙන වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර අදාළ වාර්ෂික ස්ථාන මාරු කමිටුවට භාරදීම. |
| IV. | අගෝස්තු මස 31 දිනට පෙර | - වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ ස්ථාන මාරු යෝජනා සමාජසේවා අධ්‍යක්ෂ වෙත ලිඛිතව භාර දීම. |
| V. | සැප්තැම්බර් මස 15 දිනට පෙර | - යෝජිත වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ දැන්වීම නිකුත් කිරීම. |
| VI. | සැප්තැම්බර් මස 15 දිනට පෙර | - වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව පත් කිරීම |
| VII. | ඔක්තෝම්බර් මස 15 දිනට පෙර | - වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව විසින් යෝජිත වාර්ෂික ස්ථානමාරු සම්බන්ධයෙන් වන තම ලිඛිත නිර්දේශ සමාජ සේවා අධ්‍යක්ෂ වෙත භාර දීම. |
| VIII. | නොවැම්බර් මස 01 දිනට පෙර | - වාර්ෂික ස්ථාන මාරු නියෝග නිකුත් කිරීම |
| IX. | එළඹෙන වසරේ ජනවාරි මස 01 දින සිට | - වාර්ෂික ස්ථාන මාරු නියෝග බලාත්මක වේ. |

## 07 ස්ථාන මාරු තීරණ වලට එරෙහි අභියාචනා සම්බන්ධ ක්‍රියා පටිපාටිය

1) ස්ථාන මාරු කිරීමක් පිළිබඳව දෙන ලද නියමයකට එරෙහිව කිසියම් රජයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම්, එම අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයෙහි අංක 23 පරිශිෂ්ටයට ප්‍රකාරව පමණක් ඉදිරිපත් කළ යුතු වන්නේ ය. තව ද තමන් විසින් ඉදිරිපත් කරනු ලබන කරුණු තහවුරු කිරීමට අදාල ලියවිලි වල සහතික කළ පිටපත් එම අභියාචනා සමඟ ඉදිරිපත් කිරීමට ද, ඔහු ක්‍රියා කළ යුතු වන්නේ ය.

2) රජයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතු වන්නේ සමාජ සේවා අධ්‍යක්ෂ මඟින් වන අතර, එම අභියාචනයේ පිටපතක් අදාළ පරිදි ආයතන ප්‍රධානී හා සමාජ සේවා අධ්‍යක්ෂ වෙත ද යොමු කළ යුතු වන්නේ ය. තමන් වෙත ඉදිරිපත් වන අභියාචනය අප්‍රමාදවම තම නිරීක්ෂණ සහිතව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීම සමාජ

Scanned with CamScanner

සේවා අධ්‍යක්ෂකගේ වගකීම වන්නේය. නිලධරයාට තම කැමැත්ත පරිදි අභියාචනයේ ප්‍රගමන පිටපතක් සෘජුවම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ හැක්කේය.

3) සමාජ සේවා අධ්‍යක්ෂ විසින් කරන ලද ස්ථාන මාරු කිරීමේ නියමයකට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනයක්, එම ස්ථාන මාරු කිරීමේ නියමය අදාළ රජයේ නිලධරයා වෙත ලද දින සිට දින 14 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වන්නේ ය. නියමිත කාලය තුළදී නොවන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්නේය.

4) රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා නිලධරයෙකු විසින් භාර දෙනු ලබන අභියාචනය අදාල සියළු ලිපි ගොනු ලිපි ලේඛන හා වාර්තා ආදියද, ඊට අදාළ තම නිරීක්ෂණ ද, නිර්දේශ ද සහිතව එම අභියාචනය ලැබී දින 15 ක් ඇතුළත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කිරීමට අදාළ ආයතන ප්‍රධාන හා සමාජ සේවා අධ්‍යක්ෂ වගබලා ගතයුතු වන්නේය. එසේවුද වුවත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයෙහි XVIII වැනි පරිච්ඡේදයේ සඳහන් වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධ අභියාචනා අදාළ ලිපිගොනු, ලිපි ලේඛන හා වාර්තා නිරීක්ෂණ හා නිර්දේශ සමඟ දෙසැම්බර් මස 01 වන දිනට ප්‍රථම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වන්නේය.

5) මෙම නියමයන්ට අනුගතව තම අභියාචනා ඉදිරිපත් කිරීම සෑම රජයේ නිලධරයෙකුගේම වගකීම වන අතර, ඊට පටහැනිව ඉදිරිපත් කරනු ලබන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සලකා බලනු නොලබන්නේය.

6) ඉහත 10 වගන්තියේ සඳහන් ලියවිලි ලැබී දින 15 ක් ඇතුළත ස්ථාන මාරු කිරීමේ නියමයකට එරෙහිව රජයේ නිලධරයෙකු විසින් ඉදිරිපත් කර ඇති අභියාචනා සම්බන්ධයෙන් තීරණයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ඇත්තේය.

7) ඉහත සඳහන් පරිදි ඉදිරිපත් කර ඇති අභියාචනයක් සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය සෘජුවම අභියාචක වෙත දන්වනු ලබන අතර, එහි පිටපත් අදාළ සමාජ සේවා අධ්‍යක්ෂ හා ආයතන ප්‍රධාන වෙත යවනු ලබන්නේය.

8) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගයකින් හෝ තීරණයක් හෝ අතෘප්තියට පත්වන රජයේ නිලධරයෙකුට 2002 අංක 4 දරණ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය පනතේ සඳහන් විධිවිධාන වලට අනුකූලව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම ඇත්තේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

සමාජ සේවා අධ්‍යක්ෂ
සමාජ සේවා දෙපාර්තමේන්තුව

Scanned with CamScanner